# භාෂාව හා මුළාව

භාෂාවක් යනු කුමක් ද? එය අනිවාර්යයෙන් ම සන්නිවේදනය සඳහා යොදා ගැනෙන්නකි. මේ සන්නිවේදනය තමන් හා අනෙකකු අතර මෙන් ම තමන් හා තමන් අතර ද වන්නක් විය හැකි ය. භාෂාව වියුක්ත වෙයි. මිනිසුන්ට ඇති විශේෂිත හැකියාවක් නම් වියුක්ත චින්තනය ය. මෙයින් අදහස් කරන්නේ අනෙක් ප්‍රාණීන්ට වියුක්ත චින්තනයක් ඇත්තේ ම නැත යන්න නොවේ. මේ කාරණය අපේ ජීව විද්‍යාවක් මගින් ගවේෂණයට භාජනය විය යුතු ය. ඒ කෙසේ වෙතත් අපට පැහැදිලිව ම පෙනී යන කරුණක් නම් මිනිසුන් අතර ද වියුක්තභාවයේ තරාතිරම් ඇති බව ය. පුද්ගලයන් හා පුද්ගලයන් අතර මෙන් ම සංස්කෘතීන් හා සංස්කෘතීන් අතර ද වියුක්තභාවයේ වෙනස්කම් ඇත. යුදෙව් වැනි සංස්කෘතීන් සිංහල වැනි සංස්කෘතීන්ට වඩා වියුක්ත ය. නැගෙනහිර යුරෝපීය සංස්කෘතීන් බටහිර යුරෝපීය සංස්කෘතීන්ට වඩා වියුක්ත ය. ගණිතය, භාෂාවට වඩා වියුක්ත ය. භාෂාවෙහි ද ව්‍යාකරණය පිළිබඳ දැනුම භාෂාව රස විඳීමට වඩා වියුක්ත ය. ව්‍යාකරණයෙහි වියුක්ත විශ්ලේෂණයක් වෙයි. ගණිතයෙහි දක්ෂයනට ව්‍යාකරණය ද, ව්‍යාකරණයෙහි දක්ෂයනට ගණිතය ද වටහා ගැනීම අපහසු නොවේ. එය එසේ නොවන්නේ නම් එතැන ඉගැන්වීමෙහි වරදක් තිබින්නේ යැයි සිතමි.

සංස්කෘතීන් හා සංස්කෘතීන් අතර වියුක්තභාවයේ ඇති වෙනස නිසා ඒ ඒ සංස්කෘතීන් තුළ බිහිවෙන භාෂා හා ගණිත වියුක්තභාවයෙන් වෙනස් වෙයි. භාරතීය ගණිතය පසුව බටහිර පහළ වූ ගණිතය තරම් වියුක්ත නොවේ. ඒ ඒ භාෂා ගැන විශ්ලේෂණයක් කිරීමෙන් ඒ භාෂා ඇති වූ සංස්කෘතිවල වියුක්තභාවය දැන ගත හැකි යැයි සිතමි. ඒ කෙසේ වෙතත් භාෂා නිර්මාණය වන්නට ඇත්තේ මිනිස් ඉතිහාසයෙහි යම් කාල පරිච්ඡේදයකට පසුව යැයි උපකල්පනය කළහොත්, භාෂා නිර්මාණය සඳහා මිනිස් චින්තනයෙහි වියුක්තභාවය යම් ප්‍රමාණයකට වර්ධනය විය යුතුව තිබුණි යැයි අනුමාන කළ හැකි ය. අපි දැනට ඒ අනුමානය තුළ කටයුතු කරමු. සමහර විට අප වැරදි විය හැකි බව ද සිත්හි දරා ගත යුතු ය.

වියුක්තභාවයෙන් වැඩි ගණිතය ඇති වන්නට ඇත්තේ භාෂාව නිර්මාණයෙන් වීමෙන් පසුව විය යුතු ය. ඇමරිකන් වාග් විද්‍යාඥයකු වූ නෝම් චොම්ස්කි විද්වතාණන්ට අනුව ළදරුවන්ට භාෂා ඉගෙනීමට හැකි වී ඇත්තේ මිනිස් මොළය භාෂා ඉක්මවා යන පාර ව්‍යාකරණයක් (මෙටා ග්‍රැමර්) හඳුනාගැනීමට හැකි වන අයුරින් වර්ධනය වී ඇති බැවිනි. මේ නිගමනයට චොම්ස්කි මහතා පැමිණෙන්නේ ළදරුවන් භාෂාවක් ඉගෙන ගන්නා ආකාරය ගැන සැලකිලිමත් වීමෙනි. ළදරුවන්ට දෙමව්පියන්ගෙන් හා අනෙක් අයගෙන් ලැබෙන්නේ වචන හා වාක්‍ය කිහිපයක් පමණකි. එහෙත් මේ වාක්‍ය කිහිපය ලැබුණු පසු ළදරුවන්ට අර වචනවලින් විවිධ වූ වාක්‍ය රාශියක් නිර්මාණය කර ගත හැකි ය. අප කතා කරන එක් එක් වාක්‍යය අපට වැඩිහිටියන් ඉගැන්වූවක් නොවේ. අප ඉගෙන ගන්නේ වාක්‍ය කිහිපයක් පමණකි. එහෙත් ඒ වාක්‍ය කිහිපය ඉගෙන ගත් පසු එහි ඇති රටා තේරුම් ගැනීමටත් ඒ රටා අනුව විවිධ වාක්‍ය තනා ගැනීමටත් අපට හැකිවෙයි. මේ රටා පසුපස ඇත්තේ ද යම් ව්‍යාකරණයකි. ව්‍යාකරණය යනු රටාවක් මිස අනෙකක් නොවේ. ගණිතය ද රටාවකි. යම් ආකාරයක රටා හඳුනාගැනීමෙහි දක්ෂයෝ ගණිතයෙහි දක්ෂ වෙති. භාෂා රටා හඳුනාගැනීමට ද ගණිත රටා හඳුනාගැනීමට ද යම් ආකාරයක වියුක්තභාවයක් අවශ්‍ය වෙයි. භාෂාවක් කතා කළ හැකි ඕනෑම අයකුට යම් වියුක්ත හැකියාවක් තිබේ.

මිනිසුන් භාෂා නිර්මාණය කර ගැනීමට පෙර චිත්‍ර ඇඳීමට හා සංගීතයට යොමු වී ඇත්නම් අප පුදුම විය යුතු නොවේ. භාරතීය හා බටහිර නූතනත්වයෙන් පසුව නිර්මාණය වූ සංගීත මෙන් ම බටහිර වියුක්ත චිත්‍ර ශිල්පය (ඇබ්ස්ට්‍රැක්ට් ආර්ට්) නමින් හැඳින්වෙන චිත්‍ර වියුක්ත වුවත් චිත්‍රය හා සංගීතය ආරම්භයේ දී අදහස් හා හැඟීම් ප්‍රකාශ කිරීමෙහි ලා සංයුක්ත විය. මිනිසකු සතකු දඩයම් කිරීම පිළිබඳ අදහස ඒ සඳහා වාක්‍යයක් හෝ වාක්‍ය ඛණ්ඩයක් නිර්මාණය කිරීමෙන් සන්නිවේදනය කරනවාට වඩා සරල චිත්‍රයක් ඇඳීමෙන් සන්නිවේදනය කිරීම පහසු ය. සරල චිත්‍රය සංයුක්ත වෙයි. ඒ බැලූ විගස ඉන් නිරූපණය වන්නේ කුමක් ද යන්න පැහැදිලි වෙයි. (නිරූපණය යනු කුමක්දැයි තේරුම් ගැනීම වියුක්ත වුවත් එය එතරම් අපහසු දෙයක් නොවේ. මිනිසකුගේ චිත්‍රයෙන් මිනිසකු ද සතකුගේ චිත්‍රයෙන් සතකු ද නිරූපණය වන බව තේරුම් ගැනීම පහසු දෙයකි.)

© Prof. Nalin De Silva

එහෙත් මිනිසා සතෙක් මැරීය යන වාක්‍යය සලකන්න. මෙහි මිනිසා යන වචනය, එනම් ඒ ශබ්ද මාලාව, මිනිසකුගේ චිත්‍රය මෙන් මිනිසා සමග බැඳී නැත. මිනිසා යන ශබ්ද මාලාව හා මිනිසා අතර ඇත්තේ ඉතා වියුක්ත සම්බන්ධයකි. අපට අවශ්‍ය නම් ඒ සඳහා වෙනත් ශබ්ද මාලාවක් තනාගත හැකිව තිබුණි. එහෙත් චිත්‍රයක මිනිසා නිරූපණය කළ හැකි ආකාර සීමිත වෙයි. (වියුක්ත චිත්‍ර සඳහා එය වලංගු නොවෙයි.) චිත්‍රය ද එක්තරා ආකාරයකින් ගත් කල සංකේතයක් වුවත් මිනිසා යන වචනය එයට වඩා බෙහෙවින් වියුක්ත වූ සංකේතයක් වෙයි. ගණිතයෙහි එන සංකේත එයට ද වඩා වියුක්ත වෙයි. සංගීතය ද එලෙස ය. මුල් නාද රටා හැඟීම් දැනවීමට පහසු නාද රටා වූවා නිසැක ය. අසවලා මිය ගියේ ය යන්න වියුක්ත වාක්‍යයකි. ඒ මිය යෑම පිළිබඳ හැඟීම වාක්‍යයෙන් කියැවෙනවාට වඩා හැඟීම් දනවන ආකාරයකින් සරල සංගීත ඛණ්ඩයකින් ප්‍රකාශ කළ හැකි ය.

අමරදේව මහතා ඇතැම් විට රැන්ඩොල්ෆ් නම් විද්වතා උපුටා දක්වමින් කරන ප්‍රකාශයක් ගැන අපට තවත් අර්ථයකින් නැවත සිතීමට සිදුවෙයි. රැන්ඩොල්ෆ් විද්වතාට අනුව සංගීතය ඇරඹෙන්නේ වචනය නැවතුණු තැනින් ය. ඇතැම් විට ඉතිහාසයේ දී එය අනෙක් පැත්තට සිදු වන්නට ඇත. වචනය ඇරඹුණේ සංගීතය හා චිත්‍රය වියුක්ත වීමෙන් පසුව විය හැකි ය. වචන යනු සංකේත ය. සංකේත ලෙස ඒවා වියුක්ත ය. සංකේතාත්මක ව සිතීමට (එනම් තමන් හා තමන් අතර සන්නිවේදනය කර ගැනීමට) හා අදහස් ප්‍රකාශ කිරීමට (තමන් හා අනුන් අතර සන්නිවේදනය කර ගැනීමට) මිනිසාට හැකි වීම ම වියුක්ත චින්තනයෙහි ප්‍රතිඵලයකි. වර්තමානයෙහි බටහිර ගණිතයෙහි සංකේතාත්මක ව සිතීම හා අදහස් ප්‍රකාශ කිරීම ඉතා ඉහළ තලයකට වර්ධනය වී ඇත. ගණිතය ද භාෂාවක් බව අමතක නොකළ යුතු ය. ඒ ඒ සංස්කෘතීන් හි ඇති වී තිබෙන භාෂා ගැන අධ්‍යයන රාශියක් කිරීමට අවස්ථාව උද්ගත වී ඇත.

භාෂා ඇති වීමෙන් පසු භාෂාව සංස්කෘතිය වෙනස් කිරීමට ද දායක වෙයි. මෙහි ඇත්තේ චක්‍රීය සම්බන්ධයකි. සංස්කෘතිය හා භාෂාව පමණක් නොව වෙනත් දෑ ද එකට බැඳී ඇත. මේ චක්‍රීය සම්බන්ධය ඒක රේඛීය සම්බන්ධයක් බවට පත් කිරීමට බටහිර පශ්චාත්නූතනවාදීහු උත්සාහ දරති. එයට හේතුව බටහිර චින්තනය ම ඒක රේඛීය හා ඌනිතවාදී වීම ය. මිනිසා භාෂා නිර්මිතයක් පමණක් යැයි කීම ඌනිතවාදී වෙයි. මිනිසා භාෂාව නිර්මාණය කරන්නා ද වෙයි. භාෂාව යනු ඖපපාතික ව පහළ වූ දෙයක් හෝ දෙවියන් වහන්සේ විසින් දෙන ලද දෙයක් හෝ නොවෙයි. භාෂාවට මිනිසාගෙන් තොරව පැවැත්මක් නැත. මෙහි භාෂා යනුවෙන් හැඳින්වෙන්නේ මිනිස් භාෂා බව කිව නොයුතු වුවත් බොරු පණ්ඩිතයන් සිටින රටක එසේ ප්‍රකාශ කිරීමට සිදු වෙයි. නොඑසේ නම් වෙනත් ග්‍රහ ලෝකයක හෝ සතුන් අතර හෝ මිනිසාගෙන් තොරව භාෂා පැවතිය නොහැකි දැයි බොරු පණ්ඩිතයකු අමන ප්‍රශ්නයක් ඇසීමට ඉඩ තිබේ.

සංස්කෘතිය, භාෂාව, විද්‍යාව, ගණිතය ආදී මේ කිසිවකට මිනිසාගෙන් තොරව පැවැත්මක් නැත. මෙවැනි දෑ ඊනියා වාස්තවිකයන් බවට පත්කරන්නෝ බටහිරයෝ ය. ඒ ඔවුන්ට වාස්තවිකත්වයෙන් ගැලවීමට නොහැකි වීම නිසා ය. දැනුම සංස්කෘතියට ද සාපේක්ෂ බව සැබෑ නමුත් සංස්කෘතිය ද නිර්මාණය කරන්නේ මිනිසා ය. එනම් මිනිසාගේ මනස ය. එහෙත් මෙයින් කියැවෙන්නේ මනස වාස්තවික යන්න හෝ බ්‍රහ්මන් හෝ වෙනත් යමක් යන්න නොවේ. මනස ද මනසේ ම නිර්මාණයකි. මේ චක්‍රීය චින්තනයයි. මේ සිංහල බෞද්ධයන්ගේ චින්තනයයි. දැනුම එක් එක් මනසේ නිර්මාණ වන අතර මනස ද මනසේ ම නිර්මාණයක් වෙයි. දැනුම සාපේක්ෂ වෙයි. එහෙත් සාපේක්ෂව දැකීම යනු නිරපේක්ෂව පවත්නා යමක් සාපේක්ෂ ව දැකීම නොවේ. එලෙස යමක් නිරපේක්ෂ ව පවතින්නේ යැයි ගැනීම ම ආත්මවාදී වෙයි. නිරපේක්ෂ ව පවතින යමක් යනු වාස්තවික වූවකි. අපි මේ සියළු දර්ශන ප්‍රතික්ෂෙප කරමු. අපි නිර්මාණාත්මක සාපේක්ෂතාවාදීහු වෙමු. යමක් නිර්මාණය කරන්නේ නිරීක්ෂකයා ම ය. නිරීක්ෂකයා යමක් නිර්මාණය කරන්නේ අනිත්‍ය දුක්ඛ අනාත්ම අනවබෝධයෙනි. ඒ අනවබෝධය නිසා අපි ආත්මවාදී වාස්තවික සංකල්ප නිර්මාණය කරමු. පොල් ගෙඩිය මෙන් ම ගුරුත්වාකර්ෂණය ද එසේ නිර්මාණය කෙරෙන ආත්මවාදී සංකල්ප වෙයි.

භාෂාව අපට ප්‍රශ්නයක් වන්නේ ඒ නොදැන යොදා ගැනීමෙනි. අප විසින් ම නිර්මාණය කරන ලද පොල් ගෙඩිය යන්න ආත්මවාදී පවත්නා දෙයක් ලෙස ගැනීමට භාෂාව අපට උගන්වයි. මෙහි දී භාෂාව කීව ද එයින් සංස්කෘතිය ගම්‍ය වෙයි. එහෙත් අප දැනගත යුතු කරුණ නම් සංස්කෘතිය ද අපේ නිර්මාණයක් බවත් ඒ නිර්මාණය කෙරී ඇත්තේ ම අනිත්‍ය දුක්ඛ අනාත්ම අනවබෝධය නිසා බවත් ය. පොල් ගෙඩිය පවත්නා දෙයක් බව පොල් ගෙඩිය යන්න සංකල්පය

අපට කියයි. අප මෙහි දී තේරුම් ගත යුතු ප්‍රධාන ම කරුණ නම් නැති පොල් ගෙඩිය පවත්නා දෙයක් ලෙස සලකමින් පොල් ගෙඩිය යන සංකල්පය නිර්මාණය කෙළේ අප ම බව ය. බටහිර පශ්චාත්නූතනවාදීන් තේරුම් නොගන්නා කරුණ ද එය ම ය. ආත්මවාදීන් වූ බටහිර පශ්චාත්නූතනවාදීන්ට එය කෙසේ තේරුම් ගත හැකි ද?

භාෂාවෙන් අප මුළා වන්නේ එය අපේ ම නිරමාණයක් ලෙස නොගන්නා බැවිනි. බටහිර පශ්චාත්නූතනවාදීන් අප භාෂාවේ නිර්මිත ලෙස ගන්නා කළ ඉන් ගොඩ එන්නේ කෙසේ ද? ඔවුන්ට කළ හැක්කේ තව තවත් අවුලෙන් අවුලට වැටීම පමණකි. එහෙත් බටහිරයන් අපට උගන්වා ඇත්තේ ඔවුන් වැටෙන වළ අපට ද වැටෙන්නට ය. එබැවින් මෙරට අනුකාරකයෝ දූව ගෙන ගොස් වළට පනිති. පොල් ගෙඩිය යන සංකල්පය පළමුවෙන් ම වියුක්ත සංකල්පයකි. (ගෙඩිය යන්න එයටත් වඩා වියුක්ත බව අමතක නොකළ යුතු ය.) ඒ ශබ්ද මාලාව හා අපේ මනස ද ඇතුළු ඉන්ද්‍රියයන්ට ගෝචර වන පොල් ගෙඩිය අතර සම්බන්ධයක් නැත. මෙයින් කියැවෙන්නේ ඉන්ද්‍රිය ගෝචර පොල් ගෙඩිය පවතින බවක් නොවේ. වචනය තිබුණත් නැතත් අපි මනසේ ආධාරයෙන් පොල් ගෙඩිය පිළිබඳ චිත්ත රූපයක් නිර්මාණය කර ගන්නෙමු. වචනය මෙහි දී වැදගත් නොවේ. වචනය යන්න චිත්ත රූපයට දෙන වියුක්ත නමක් පමණකි. නම නැතිව වුව ද චිත්ත රූපය නිර්මාණය කෙරෙයි. භාෂාව නිර්මාණය කිරීමට පෙර ද මිනිසුන් පොල් ගෙඩිවල රූප අඳින්නට ඇත්තේ එබැවින් ය. අප මුළා වන්නේ භාෂාවෙන් පමණක් නොවේ. භාෂාවක් නිර්මාණය කර ගැනීමට පෙර ද අපි මුලා වී සිටියෙමු. ඒ චිත්ත රූප නිර්මාණය කර ගැනීමෙනි. චිත්ත රූපයක් යනු ම සංකල්පයක් වෙයි. නාම රූප යන තැන්හි නාම යනු භාෂාවේ නාම පද යැයි වරදවා නොගත යුතු ය. එසේ ගතහොත් භාෂා නොදන්නන්ට නාම රූප නැත! සංකල්පයක් ම නාමයක් වෙයි. භාෂාවක් නොදන්නා ළදරුවෝ ද මුළා වෙති. බටහිර පශ්චාත්නූතනවාදී භාෂා නිර්මිත පුද්ගලයන් පිළිබඳ මතවාදවලින් ගම්‍ය වන්නේ ළදරුවන් මුළා නොවන බව ය. මෙයටත් වඩා මුළාවක් තවත් තිබිය හැකි ද?

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva